(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 232.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 දෙසැම්බර් මස 09 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

839/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇතැම් නගරාන්තර දුරගමන් සේවා සීඝ්‍රගාමී දුම්රියවල නිදන මැදිරි ජරාජීර්ණ වී ඇති බවත්;

(ii) ඇතැම් දුම්රියවල ආපනශාලා පහසුකම් නොමැති බවත්;

(iii) පවතින ආපනශාලා විධිමත් නොවන බවත්;

(iv) දුම්රිය ආපනශාලාවල ප්‍රමිතියෙන් බාල ආහාරපාන අධික මිල ගණන්වලට විකුණනු ලබන බවත්;

(v) ඉහත සඳහන් කරුණු හේතුකොට ගෙන දුම්රිය මගීන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත දුම්රියවල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන පියවර කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුදල ඇස්තමේන්තුගත කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1386/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 144 යටතේ, ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 150 ක් පමණ වන බව සඳහන් කර ඇති බැවින්, 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන ප්‍රමාණය හා අපනයන වටිනාකම දැක්වෙන ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) යුරෝපා වෙළඳපොළට මත්ස්‍ය අපනයන තහනම් කිරීමට තුඩු දුන් හේතු සාධක කවරේද;

(iii) තහනම ඉවත් කරවා ගැනීම සඳහා, එවකට ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) යුරෝපා වෙළෙඳපොළට මත්ස්‍ය අපනයන තහනම ඉවත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒ අනුව මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1469/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) දැනට ස්ථිර ග්‍රාම නිලධාරියෙකු සිටින ග්‍රාමනිලධාරී වසම් හා එහි සේවයේ නියුතු ග්‍රාම නිලධාරින්ගේ නම් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1743/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද පත්වීම්ලාභීන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1872/'17

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුබැද්ද, බණ්ඩාරනායක මාවතේ දකුණු පස පිහිටි ජලාශය වටා ඇවිදින මංතීරුවක් ඉදිකරමින් තිබියදී එහි වැඩ අතරමග නවතා දැමූ බවත්;

(ii) නැවත මං තීරුවේ වැඩ අරඹා විශාල වැඩ කොටසක් නිමකර තිබියදී, එහි කොන්ත්‍රාත්කරු විසින් වැඩ නවතා 2016.09.12 දින යන්ත්‍රසූත්‍ර ද ඉවත් කරගෙන යෑමෙන් යළිත් එහි වැඩ ඇණ හිට ඇති බවත්;

(iii) මේ වනවිට එම ජලාශයට සහ ඒ අවට ප්‍රදේශයට කුණු බැහැර කිරීම සඳහා භාවිතා කිරීම හේතුවෙන් විශාල පරිසර දූෂණයක් සිදුවී මදුරු ගහනයද විශාල වශයෙන් වැඩි වී ඇති බවත්;

(iv) මංතීරුව ඉදිකිරීම නවතා දැමීම හේතුවෙන් පවිත්‍ර කළ ජලාශය හා ඇළ මාර්ගය මේ වනවිට මුළුමනින්ම වල්බිහිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මංතීරුව ඉදිකිරීමට සහ අධිකව අපවිත්‍ර වී ඇති ජලාශය පවිත්‍ර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වැඩ යළි ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) මෙතෙක් සිදුකළ කටයුතු වෙනුවෙන් දැරූ වියදම වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2109/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, මතුගම අධ්‍යාපන කලාපයේ පිහිටි කලෙලමගල් දෙමළ විද්‍යාලයේ ශිෂ්‍යයන් හාරසියයකට අධික පිරිසක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබමින් සිටින බවත්;

(ii) මෙම පාසල "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා මාස දෙකකට පෙර මුල්ගල් තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඉහත පාසලෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම පන්ති ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2148/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත තුළ දියත් කරන ලද වාරි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාරි ව්‍යාපෘතිවල නම් කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන ග්‍රාම නිලධාරි වසම් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවල අරමුණු කවරේද;

(v) ජල හිඟයෙන් පීඩා විඳින වයඹ ජනතාව වෙනුවෙන් අමාත්‍යාංශය ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2284/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එම නිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුනේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 23 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි සහ 2016.03.08 හා 2017.11.15 යන දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 22 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක1),— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන් වුවද, 2017.12.11 වැනි සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය. එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට පූ. භා. 10.30 දක්වා විය යුතු ය. පූ. භා. 10.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2018) — (විසිහතරවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 08 දින ප්‍රගතිය)

*2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු, 32 වගන්තිය යටතේ, සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 28 දිනැති අංක 2029/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 996 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 30 දිනැති අංක 2021/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 30 දිනැති අංක 2025/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 19 දිනැති අංක 2028/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 26 දිනැති අංක 2029/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 31 දිනැති අංක 2030/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 01 දිනැති අංක 2030/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 15 දිනැති අංක 2032/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 11),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 23 දිනැති අංක 2033/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 12),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 2035/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 13),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 02 දිනැති අංක 2039/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.11.18 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2017 අගෝස්තු 11 දිනැති අංක 2031/49 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22 වගන්තිය යටතේ, මත්පැන් සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.30 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1000 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 2 වගන්තිය යටතේ, සුරාබද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.30 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1001 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 3),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22 වගන්තිය යටතේ, එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය මත සුරාබදු අනුපාත සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.30 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1002 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 4),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22 වගන්තිය යටතේ, 2015 දෙසැම්බර් 04 දිනැති අංක 1943/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අංක 981 දරන සුරාබදු නිවේදනය අවලංගු කරමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.30 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1003 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.12.08 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ (3) උපවගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.29 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ (3) උපවගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.29 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව,— සලකා බැලීම.

*29.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

36.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2018) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ “දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය” නමැති පත්‍රිකාව බලන්න.